# දේවාල පුල්ලියෝ

"පුල්ලියා" කියන වචනය කොහෙන් ආපු එකක්ද කියා නොදිනිමි. එහෙත් එය ලස්සන පදයකි. දේවාලය කැත කරන අයට කියන නමක් බව හිතා ගත හැකිය.

මා මේ දේවාලේ පැත්තේ යන ගමන්. මගේ ගමන ටිකක් දිගයි. පාර දුර නිසා. මට සිද්දවෙලා තියෙන්නේ නමක් දරන පාරකින් යන්නයි. ඒකයි රඹුක්වැල්ල පාර තෝරගත්තෙ . දුර ගැන කල්පනා නොකරම.

රඹුක්වැල්ල කියනකොටම මට පරණ කවියක් මතක් වෙනවා. ඒකත් කියලාම ඉතුරුටික යමු.

වන්නම් කියන්නට තිබුණෝ එකම කටයි
දැන් ඒ කටත් මරුවගෙ යටි පතුල යටයි
තුන් සිංහලේ ඇස් වල අද කඳුළු නටයි
මින්පසු අපේ සාහිතයට කපුටො කොටයි

ඔය කවිය ලිව්වේ මගේ ගුරුවරයෙක්. සිරි අයියා. ගුවන්විදුලි ශ්‍රාවකයන් අතර ඒ නමින් ජනප්‍රියව සිටි යූ ඒ එස් පෙරේරා කවියා ය. කවිය ලිව්වේ ඔහුගේ ගුරුතුමා අපවත් වූ වෙලාවේ. කොළඹ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයකුව සිටි සිරි අය්යා ඔහුට ඉගැන්වූ ජනප්‍රිය සරසවි ඇදුරකු වූ රඹුක්වැල්ලේ ශ්‍රී සිද්ධාර්ථ හිමියන්ගේ ආදාහනය දා බෙදාහරින්නට මුද්‍රණය කළ ශෝක ප්‍රකාශය




කවියෙන් ලියුවේය.

ඒ කවිය අදත් අමතකව නොගොස් ඇත්තේ මහා පඬිවරයකුට පින් සිද්ද වන්නටය. කුමාරතුංග මුනදාස. කවිය දුටු ඔහු එහි වියරණ දොස් අල්ලාගෙන "සුබස" සඟරාවේ විවෘත සන්දේශයක් පළ කළේ ය. එය සිරි අය්යාට ලියුවක් නොවේ. විශ්ව විද්‍යාලයේ උපකුලපති අමතා ලියූවක්. මෙලෝ සිංහලක් නොදත් සුදු මිනිසකු වූ සර් අයිවර් ජෙනිංග්ස් ට ලියූවක්. බීරි අලියාට විණා ගායනාවක් වුවත් ඒ සන්දේශය නිසා කවි පෙළට ගැනක් ලැබුණෝය.

අද වාගේ දවසක ඒ නම ලැබෙන්නේ රඹුක්වැල්ල නිසා පමණක් නොවේ.

එහෙම වුණාට රඹුක්වැල්ලට මුල් තැන හිමි වන්නේ නැත . ඔහු අන්තිමට ම කෝප කළේ පිනුම් ගහපු කොල්ලාය. ගෝලයා ය.

මං යන මේ දේවාලේ දැන් දෙය්යන්ට තැනක් නැත . කොටින්ම කියනවා නම් දෙවියන් පැනලා ගිහින් ය. ඉන්න බැරි කමටම. දැන් එතන අද අධිපතියා අර පිනුම් ඇමති ගෝලයා නොහොත් කොල්ලාගේ තාත්තා ය. ඒ නිසා ඌට මොනවා කළත් දඬුවමක් නැත . කොල්ලා බීගෙන උඩු ගුවනේ පිස්සු නැටුවත් කපුවා ඉදිරිපත් වෙයි. පුතා බේරාගනියි. අනේ මගේ පුතාට පිනුම කියන එක තේරෙන්නේවත් නැත . ඔය වෙන ළඟඋන්නු එකෙක් මගේ කොල්ලව උස්සලා උඩ විසිකරලා වෙච්ච ඇබැද්දියක් නොවැ. මම ඒ කතාව උඩු ගුවනේ බාරකාරයාටත් දන්වලා තියෙන්නේ. මට ඒකට උත්තරයක් ආවා. මගේ කීකරු දරුවාට තරවටු කිරීම ගැන සමාව ඉල්ලලා.

ඕනෑම හොඳ වැඩක් පටන් ගන්නේ මහ තැනින්මයි. මාළිගාවෙන්මයි.

මුලින්ම මාළිගාවේ කපුවාගේ පුත්‍රයා තමයි ඔහොම වැහි කෝඩයට අහුවුණේ. ඒ අහිංසක දරුවා ක්‍රීඩා විනිශ්චයකාරයන්ගේ හොම්බට ඇන්නා කියලා. අනේ පැළවෙන බොරුවක්. තමන්ගෙම අත වැරදිලා තමන්ගේම හොම්බට වැදුණා කියලා ඒ මනුස්සයා පිළිගත්තා. කපුරාලට අතගහන්නවත් සිද්ද වුණේ නැහැ.

*<u>මුලින්ම මාළිගාවේ කපුවාගේ පුත්‍රයා තමයි ඔහොම වැහි කෝඩයට අහුවුණේ. ඒ අහිංසක දරුවා ක්‍රීඩා විනිශ්චයකාරයන්ගේ හොම්බට ඇන්නා කියලා. අනේ පැළවෙන බොරුවක්. තමන්ගෙම අත වැරදිලා තමන්ගේම හොම්බට වැදුණා කියලා ඒ මනුස්සයා පිළිගත්තා. කපුරාලට අතගහන්නවත් සිද්ද වුණේ නැහැ.</u>*

ඉන් පස්සේ තව පොඩි පොඩි කපුවන්ගේ කොල්ලෝ - ගෝලයෝ පටන් ගත්තේ නැතැයි එක එක තැන්වල පිනුම් අල්ලන්න. එහෙම පිනුම් අල්ලනකොට පිනුමට අහුවෙලා වැටෙන්නේ සෙසු පටු අය නොවෙති. තවත් කපුවකුගේ පුත්‍රයෙක්. දැන් නම් උසස් පොලිස් නිලධාරියෙක්. හැපුණු හැම කෙනෙක්ම අන්තිමට තමන්ගේ වරද පිළිගනිති. අපේ කපු මහත්තයාගේ පුතා අනේ වරදක් නැහැ. මගේ අතින්ම මට ගහගත්තා. ඒ දරුවා මොනා කරන්නද?

ඔන්න ඔහොමයි ඒ උසස් පොලිස් නිලධාරීන් පවා



පාපොච්චාරණය කරන්නේ.

ඒක හරියට රුසියාවේ ශ්‍රේෂ්ඨ නායකයාව සිටි ජෝසබ් ස්ටාලින් කාලේ හිටපු පරණ කොමියුනිස-"ට්කාරයන් මරණය දැක දැක කරපු පාපොච්චාරණ වගේමයි. මෙතන වෙනසක් ඇත . අර මිනිසුන් බයේ බයේ පාපොච්චාරණය කළත් මරණය නියත බව දැනගෙන හිටියා. මේ ශ්‍රී ලාංකික පොලිස් නිලධාරීන් ඇතුළු පුද්ගලයන්ට ඒ විදියේ අතුරු අන්තරාවක් නොවන බව ඔවුහු දැනගෙන සිටියහ. ඒ නිසා මේ සංසන්දනය නම් වැරදිලාවත් හිතන්න එපා මේ කපුරාලගේ කෝවිල ස්ටාලින්ගේ වධකාගාරය වගේ තැනක් කියලා. මෙතන සියයට සියයක ආරක්ෂාවත් . එකම එක ඇත්ත කතා කළ යුතු වීමයි. ඇත්ත කිව්වාට කපුරාලට පිළිගත හැකි කපුවාගේ කොල්ලාට හිතකර ආකාරයේ විය යුතුයි.

හොඳම නිදර්ශනය කැළණි පුරවරයෙන්ම දෙන්නට පුලුවන. අර ගස් බැන්දා කියාපු සමෘද්ධි නිලධාරියා මතකද? ඒ මනුස්සයා විසින් කරගත්තු වැඩක් බව යස අගේට ඔප්පු වුණා නොවැ. කවුදෝ හතුරෙක් කැළණියේ කපුවාට රිද්දන්න ගොතාපු මුසාවක් බව ඒ නිලධාරියාගේ කියමනෙන්ම ඔප්පු වුණා.

මෙහෙම කෝවිලෙයි පිටතයි පිනුම් ගැහිල්ලට කපුවගේ කොල්ලන් පුරුදු වුණේ ඔය කැළණිය කපුවම කරපු ජංජාලය නිසා කියලයි හැමෝම කියන්නෙ. කපුවා පින්තූර සාප්පුවකට ගොඩ වෙලා අර වළං කඩේට කඩා වැදිච්ච් ගොනා වාගෙ ඇනගෙන ඇනගෙන ගිහින් තුන් හතර දෙනකුට තුවාලත් කරලයි පස්ස බැලුවේ.

ඉතින් අපි දන්නවා නෙවැ අපි පිළිගත්තු චාරිත්‍රය. කපුවා කෝවිලේ හිටගෙන කරන දේ ගෝලයා දුව දුව කරන කතාව.

ඉස්සර නම් කපුවා දෙවියන්ට බයේ හරි අර කොල්ලට බැණලා එලවා දානවා. ඒ ඉස්සර. දැන් දෙවියන් නැති කෝවිලේ කපුවාට ඕනෑ දෙයක්. කපුවා බලන්නේ පුත්‍රයාව බේරා ගන්න. පුතත් බය නැතුව දුව දුව නොවේ - උඩ පැන පැන අර වඅඩේ කරනවා. කවුරු හරි ඒකට දොස් කිව්වොත් කපුවා ඉස්සරහට එනවා.

මේ දැන ගන්නවා. මගේ කොල්ලට දුව දුව තියා නිකම්වත් හුජ්ජ කරන්න බැහැ. ඔය කොල්ලගෙ තරහකාරයෙක් උගේ බිජ්ජට වතුර පොල්කටුවක් දාලා බොරුවට ඌ හුජ්ජ කළා කියනවා. එහෙම කිව්වට කවුද ඕවට රැවටෙන්නෙ?

අපි ඔබතුමාගේ වචනයක් පාසා විශ්වාස කරනවා. ඔය බොරු කියන එවුන්ගේ කට වහන්න හොඳ මුකවාඩමක් අපට දෙන්න. අර කොට්ටෝරුවා කටට බැඳපු මුකවාඩම වාගෙ එකක්.

ඔබතුමාලගෙ නිලමෙ කෙනෙක් කිව්වානොවැ ඔය කෙහෙල්මල් මාධ්‍ය නිදහස නිසා අපට කෙළවිලා කියලා.

අපි ඒක හරිගස්සා ගන්න බලමු.




